
# විගමනික ගෘහ සේවකයන් (FDH)




## හොංකොං නීති සහ සහ සම්මත සේවානියුක්ත ගිවිසුම (ස.සේ.ගි.) යටතේ ඔබට මේවා හිමි වේ

- සෑම දින හතකට වතාවක්ම විවේක දින එකකට නොඅඩු ගණනක්, රජයේ නිවාඩු දින සහ ගෙවන වාර්ෂික නිවාඩු සේවාදායකයන් ඔබේ විවේක දිනය තුළ රැකියාවේ යෙදීමට හෝ ඔබට රජයේ නිවාඩු දිනයක් ලබා දීම වෙනුවට ගෙවීමක් කිරීමට නොසැලැස්විය යුතුය.
- වැටුප් කාලසීමාව අවසන් වීමෙන් දින හතක් නොඉක්මවා හෝ ස.සේ.ගිවිසුම අවසන් වන දිනයට ස.සේ.ගිවිසුමේ දක්වා ඇති වැටුප් සහ ගෙවීම් කරනු ලැබීමට. ගිවිසුම්ගත වැටුප ස.සේ. ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට පවතින අවම අනුදත් වැටුපට වඩා නොඅඩු විය යුතුය.
- නොමිලේ ආහාර (හෝ ඒ වෙනුවට ආහාර දීමනාවක්), සේවාදායකයාගේ නිවහෙනහි සැලකියයුතු තරම් පෞද්ගලිකත්වයක් සහිත නොමිලේ නවාතැන් පහසුකම්, නොමිලේ වෛද්‍ය ප් රතිකාර, ගිවිසුම කල් පිරුණු/ අවසන් වූ පසු සිය දේශය බලා යාමට නොමිලේ පහසුකම්.



## රැකියා ඒජන්සියක් (රැ.ඒ.) සමඟ ගනුදෙනු කිරීමේදී, ඔබ

- රැකියා ඒජන්සියට වලංගු හොංකොං විශේෂ පරිපාලන දිසා (HKSAR) රජයෙන් නිකුත් කරන ලද රූ.ඒ. බලපත්‍රයක් තිබේදැයි සහතික කරගත යුතුය. ඔබට රූ.ඒ. බලපත්‍රය පෙන්වීමට සේවක මඩුල්ලට පවසන්න, නැත්නම් රූ.ඒ. බලපත්‍ර ලාභියා දැයි අන්තර්ජාලෙයන් බලන්න.
- තහවුරු කිරීමට අත්සන් කිරීමට පෙර ස.සේ. ගිවිසුමේ අන්තර්ගතය සහ සේවා ආවරණය ඔබට වැටෙහන බවට සහතික කර ගන්න. අත්සන් කරන ලද සේවා නියුක්ත ගිවිසුමේ මුල් පිටපත තබා ගන්න.
- සඳහන් කරන ලද කොමිස් මුදල (ඔබේ මුල් මස වැටුප් වලින් 10% උපරිමයකට යටත්ව) රූ. ඒ. වෙත ගෙවිය යුත්තේ ඔබ මුල් මස වැටුප ලබා ගත් පසුව ය. ගෙවීමක් සිදු කිරීමෙන් අනතුරුව හැකිතාක් ඉක්මනින් රූ. ඒ. වෙතින් රිසිට් පතක් ලබා ගැනීමට සහතික වන්න.
- ඔබේ පෞද්ගලික හඳුනාගැනීමේ ලියකියවිලි (උදා: හොංකොං හැඳුනුම්පත සහ විදේශ ගමන්බලපත්‍රය) සහ වෙනත් දේ (උදා: බැංකු කාඩ්පත්) ඔබ වෙත තබා ගන්න. ඔබේ සේවාදායකයා හො රැ. ඒ. කාර්යමඩුල්ල ඇතුළු වෙනත් කිසිවෙකුට ඔබට මෙම ලියකියවිලි භාර දෙන ලෙස හෝ තබා ගැනීමට බල කිරීමට නොහැක.

## ඔබේ අයිතීන් උල්ලංඝනය වි ඇති විට ඔබ

- ඔබව ශාරීරික හිංසනයට ලක් වූ විට හෝ ඔබේ පෞද්ගලික ආරක්ෂාවට තර්ජනයක් එල්ලවී ඇති විට සහය ලබා ගැනීමට වහාම "999" පොලිස් හදිසි ඇමතුම් අංකය අමතන්න.
- ඔබට ඔබේ වැටුප් නොගෙවන්නේ නම් හෝ ඔබේ සේවානියුක්තික අයිතීන් කුමක් හෝ උල්ලංඝනය වී ඇත්නම් විමසීම් සහ සහය ලබා ගැනීමට පැය 24 පුරා විවෘත කම්කරු දෙපාර්තමේන්තු හදිසි ඇමතුම් අංකය "2717 1771" අමතන්න, නැත්නම් කාර්යාල වේලාවෙහි කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු සම්බන්ධතා අංශයේ අදාළ ශාඛා කාර්යාලය වෙත යන්න.




# විගමනික ගෘහ සේවකයන් (FDH)






## රැකියාවේ නියුතු වන අතර ඔබ

- ඔබේ සේවාදායකයා හැරුණු විට අනෙක් කිසිම පුද්ගලයෙකු වෙනුවෙන් රැකියාවේ යෙදීමට හෝ ස.සේ.ගිවිසුමේ සඳහන් ලිපිනයේ හැර වෙනත් තැනක විසීමට අවසර නැත.
- ඔබට ඔබේ වැටුප් ලැබීමට ප්‍රථම වැටුප් විස්තරයක් හෝ රිසිට්පත් කිසිවක් අත්සන් නොකළ යුතුය.

## රැ.ඒ. සමඟ ගනුදෙනු කරන විට ඔබ

- රැ. ඒ. වෙත දක්වා ඇති කොමිස් මුදලට අමතරව කිසිදු ලියාපදිංචි කිරීමේ ගාස්තු, වෙන්කිරීමේ ගාස්තු සහ ඡායාපිටපත් ගාස්තු ආදි වියදම් හෝ ගාස්තු කිසිව නොගෙවිය යුතුය.
- තුන්වන පාර්ශවයක් හරහා හෝ රැ.ඒ. විසින් ඉල්ලා හෝ යෝජනා කළද කිසිදු මූල්‍යමය සේවා සමාගමකින් මුදල් ණයට ගැනීමෙන් රැ.ඒ. වෙත ගෙවීම සිදු නොකළ යුතුය.




## සෑම විටම ඔබ

- ඔබට කොන්දේසි නොවැටෙහ් නම් හෝ ඒවායේ අරුත පිළිබඳ ඔබට පැහැදිලි නොමැති නම් කිසිදු පුද්ගලෙයකු හෝ සමාගමක් සමඟ (ඔබේ සේවාදායකයා හෝ රූ.ඒ. ඇතුළුව) කිසිදු ලියවිල්ලකට හෝ ගිවිසුමකට අත්සන් නොතැබිය යුතුය.
- ඔබේ ස.සේ.ගිවිසුමේ කිසිදු අසත්‍ය තොරතුරක් (ඔබේ වැටුප් සහ රැකියා ස්ථානයේ ලිපිනය ඇතුළු) ලබා නොදිය යුතු අතර එසේ කිරීමෙන් සාපරාධී වරදක් කර ඇති බවට සැලකිය හැක.







| වැඩි විස්තර සඳහා, ඔබේ විමසීම් අදාළ ඒජන්සි වලට යොමු කරන්න නැතිනම් පහත වෙබ්අඩවි නරඹන්න: | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු | පරාසය | හදිසි දුරකථන ඇමතුම් | වෙබ්අඩවි |
| කම්කරු දෙපාර්තමේන්තුව | විගමනික ගෘහ සේවක අයිති සහ කම්කරු රෙගුලාසි | 2717 1771 (හදිසි ඇමතුම් අංකය "1823"න් හසුරුවනු ලැබේ) | www.fdh.labour.gov.hk |
| | රැ.ඒ. බලපත්‍ර සහ සඳහන් කරන ලද කොමිස් මුදල | 2115 3667 | www.eaa.labour.gov.hk |
| ආගමන දෙපාර්තමේන්තුව | විගමනික ගෘහ සේවක වීසා බලපත්‍රය | 2824 6111 | www.immd.gov.hk/eng/services/visas/foreign_domestic_helpers.html |
| රේගු සහ දෙස් බදු දෙපාර්තමේන්තුව | වෙළඳ විස්තර ආඥා පනතෙන් තහනම් කරන ලද සාධාරණ නොවන වෙළඳ භාවිත | 2815 7711 | www.customs.gov.hk |
| පාරිභෝගික කවුන්සිලය | පාරිභෝගික ආරවුල් | 2929 2222 | www.consumer.org.hk |
| හොංකොං පොලිස් බලකාය | හදිසි අවස්ථා සඳහා | 999 | |

勞工處 Labour Department

草日漫畫製作

11/2018

勞工處 Labour Department




විගමනික ගෘහ සේවකයන් සේවයේ යෙදවීමට අදාළ විගමනික ගෘහ සේවකයන්, සේවායෝජකයන් හා බඳවා ගැනීමේ ඒජන්සි සතු අයිතීන් සහ වගකීම් පිළිබඳ ක්ෂණික සඳහනක් කිරීමට මෙම අත්පත්‍රිකාවෙන් අදහස් කෙරේ. සේවය පිළිබඳ කොන්දේසි සහ නීතිමය විධිවිධාන පිළිබඳ වැඩි විස්තර සඳහා, විගමනික ගෘහ සේවකයන්, සේවායෝජකයන් හා බඳවා ගැනීමේ ඒජන්සි සම්මත සේවානියුක්ත ගිවිසුම (ID 407) සහ සේවා නියුක්ත ආඥා පනත බැලිය යුතුය. මෙම අත්පත්‍රිකාවේ දක්වා ඇති විධිවිධාන වල පූර්ණ අයිතිය සේවානියුක්ත ආඥා පනත සතු වන අතර නීතිය අර්ථ දැක්වීමේ බලය උසාවිය සතු වේ.

Sinhala Version 僧伽羅文版本

# විගමනික ගෘහ සේවකයන් ගේ සේවාදායකයන්




## හොංකොං නීති සහ සම්මත සේවානියුක්ත ගිවිසුම (ස.සේ.ගි.) යටතේ ඔබට මේවා හිමිවේ:

- ඔබේ විගමනික ගෘහ සේවකයා වෙත කලට වේලාවට සහ සම්පූර්ණයෙන් ස.සේ. ගිවිසුමේ සඳහන් වැටුප ගෙවන්න. ගිවිසුම්ගත අනුපාතය ස.සේ. ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට පැවති අවම අනුදත් වැටුප වඩා නොඅඩු විය යුතුය.
- සේවා කාලය තුළ ආහාර ලබා දෙන්නේ නොමිලේ ද යන්න පිළිබඳව ඔබේ විදෙස් ගෘහ සේවකයා සමඟ එකඟ වී එවන් ගිවිසුම් පිළිබඳ ස.සේ. ගිවිසුමේ සඳහන් කරන්න. එසේ නැතිනම්, ස.සේ. ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට පැවති අනුපාතයට නොඅඩු ආහාර දීමනාවක් සෑම මසකම විදෙස් ගෘහ සේවකයා වෙත ලබා දිය යුතුය.




- සෑම දින 7කට වතාවක්ම එකකට නොඅඩු විවේක දින ගණනක් ඔබේ විගමනික ගෘහ සේවකයාට ලබා දෙන්න.
- ඔබේ විගමනික ගෘහ සේවකයාගේ සේවා කාලය කුමක් වුවත් ඔහුට/ඇයට රජෙය් නිවාඩු දින (සෑම වසරකටම දින 12ක්) ලැබීමට සලසන්න. ඔබේ විගමනික ගෘහ සේවකයා මාස තුනක කාලයක් සේවෙය් යෙදී සිට ඇතිනම් ඔහු/ ඇය ගෙවන රජෙය් නිවාඩු දිනවලට හිමිකම් කියයි.



- ඔබේ විගමනික ගෘහ සේවකයා වෙත ඔබේ නිවහනෙහි සැලකියයුතු තරම් පෞද්ගලිකත්වයක් සහිතව සුදුසු නවාතැන් පහසුකම් සපයන්න.
- වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, අදාළ තානාපති කාර්යාලයේ වලංගු කිරීමේ ගාස්තු, වීසා බලපත්‍ර ගාස්තු, රක්ෂණ ගාස්තු, පරිපාලන ගාස්තු හො පිලිපීන විදෙස් සේවා නියුක්ත පරිපාලන ගාස්තුව වැනි ගාස්තු හෝ ඊට සමාන අදාළ රාජ්‍ය අධිකාරීන් විසින් අවශ්‍ය කරන වෙනත් ගාස්තු වැනි අවශ්‍ය ලියකියවිලි ලබා ගැනීමට ගත වන වියදම් ඔබේ විගමනික ගෘහ සේවකයා වෙත නැවත ලබාදෙන්න

